# ලංකාණ්ඩුවේ "ගැසැට්" පත්‍රය.

CEYLON GOVERNMENT GAZETTE No. 6,243, MAY 21, 1908.


## SINHALESE TRANSLATIONS OF NOTIFICATIONS.

[By-Laws relating to Bakeries, Local Board, Ambalangoda.]

වර්ෂ 1862කේ 15 වෙනි ආඥාපණතේ 5 වෙනි වගන්තියේ ප්‍රකාරයට දකුණු පලාතේ සනීප ආරක්ෂාකිරීමේ සභාව විසින් අම්බලන්ගොඩ නගරයට සාදනලද මෙහි පහත සඳහන්වන අතුරු පණත් කාරක මන්ත්‍රීසභාවේ සම්මතය ඇතුව ගරුතර උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකරනලදින් පොදුජනයාගේ දැනගැනීම පිණිස ප්‍රසිද්ධකරනු ලැබේ.

ගරුතර උතුමාණන්වහන්සේගේ අණ‍ුවලෙස,

වර්ෂ 1908ක්වූ මැයි මස 18 වෙනි දින කොළඹ
මහ සෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

හියු ක්ලිෆර්ඩ්,
මහ සෙක්‍රතාරිස් වම්හ.

### පාන් ගෙවල්.

1. පාන්ගෙවල් හරිඅන්දමට සෑදිය යුතුයි.—සියළු පාන්ගෙවල්ව වාතාශ්‍රයත් එළියත් හොඳට ඇතුව බිත්ති හුණු බදම අල්ලා සුදු හුණු ගා බිම සිමෙන්ති අල්ලා දිය බස්සවා හැරීමට සෑහෙන පමණ කාණු සහිතව තිබාගත යුතුයි.

2. කක්කුසුවලින් දුර ප්‍රමාණය.—කිසි පාන්ගෙයක් කක්කුස්සකින්, වැසිකිලියකින් නොහොත් බිම්යට කාණුව කින් අඩි තිහක් ඇතුළතවත්, එයින් හුළඟට ගසා යන දුගඳ වැදහැකි දුර ප්‍රමාණයක් ඇතුළතවත් නොතිබියයුතුයි.

3. භාජන.—පාන්ගෙයකට අයිති සියළු භාජනද වෙන සියළු උපකරණද ශුද්ධපවිත්‍රව තබාගත යුතුයි.

4. පිටි ආදිය යහපත්විය යුතුයි.—පාන් සෑදීම පිණිස ගන්නා පිටි, වතුර සහ වෙනත් ද්‍රව්‍ය හොඳ සනීප වඩනා ද්‍රව්‍ය විය යුතුයි.

5. පාන්ගෙවල් ශුද්ධ පවිත්‍රව තිබිය යුතුයි.—පාන්ගෙය පිහිටි ඉඩම් කඩවෙද, ඉන් අවටද ඇති සියළු අහක දමනා දේද, කුණුද අප්‍රමාදව ඉවත්කළ යුතුයි.

6. පාන්ගෙයක වැඩකරන්නෝ.—පිළිකුල් හෝ බෝවෙන නොහොත් පැතිරියන රෝගයකින් පෙලෙන කෙනෙක්වත්, එබඳු කෙනෙකුට අළුතකදී සාත්තුකළ කෙනෙක්වත් ඇඟ නොසෝද හෝ වෙන අන්දමකින් අපිරිසිදු කෙනෙක්වත් පාන්ගෙයක වැඩට නොගත යුතුයි.

7. පාන්ගෙවල් විභාග පරීක්ෂාවට ඉඩඇරී තිබිය යුතුයි.—සියළු පාන්ගෙවල්වලම වැඩපල කෙරෙන හැටිද, ඒවා පවත්වාගෙන එන හැටිද, සනීප ආරක්ෂාකිරීමේ සභාවේ ප්‍රධානතැනගේද, සනීප ආරක්ෂකතැනගේද, ප්‍රධාන තැනගෙන් බලයලත් සියල්ලන්ගේද විභාගපරීක්ෂාවට යටත්ව ඒට ඉඩඇරී තිබිය යුතුයි.

---

[By-Laws relating to Bakeries, Local Board, Bandarawela.]

වර්ෂ 1898ක්වූ අවුරුද්දේ නොම්මර 13 වෙනි ආඥාපණතේ 56 වෙනි වගන්තියේ 5 වෙනි සුළු වගන්තිය ප්‍රකාර තිරිඟුවලින් සාදන පාන්පෝර්ණු සම්බන්ධ උපවගන්ති:—

1. සෑම පෝර්ණුවල බිත්ති හුණුගෙන් කපරාදුකර සුදුකර පොළවට සිමෙන්ති දමා වතුරබස්නාව සෑහෙන විධියට තබන්ට ඕනෑය.

2. කොයියම් පෝර්ණුවක්වත් කසල වළකට හෝ කක්කුස්සියකට හෝ අඩි තිහකට මෑත තබන්වවත් දුර්ගන්ධයක් එන්නාවූ ස්ථානයකවත් තබන්ට බැරිය.

3. කොයියම් පෝර්ණුවකට පාවිච්චිකරණ ස්ථානයක් වෙන මොනම කාරණාවකටවත් පාවිච්චිකරන්ට බැරිය.

4. සෑම භාජන සහ ලිඛඩුත් පිරිසිදුව තබන්ට ඕනෑය.

5. පාන් සෑදීමට ගන්න පිටි, වතුර සහ වෙන ද්‍රව්‍යයත් හොඳකාර පිරිසිදුව තබන්ට ඕනෑය.

6. පෝර්ණුවේ සහ ඒට අසලත් තිබෙන කුණුකසල අතුගා ශුද්ධකොට කාණු හොඳට සෝද තබන්ට ඕනෑය.

7. බෝවෙන හෝ අපිරිසිදු රෝගයකින් පීඩිත අයෙක් හෝ එබඳු රෝගකාරයෙකුට ළඟදී සාත්තුකළ කෙනෙක් හෝ නාලා ශුද්ධපවිත්‍රනුවූ නොහොත් වෙන අන්දමකින්වත් අපිරිසිදු කෙනෙක් පාන් පෝර්ණුවක වැඩට පත්කරන්ට බැරිය.

8. ලෝකල්බෝර්ඩ් සභාවේ ඉන්ස්පැක්ටර් කෙනෙකුට හෝ එම සභාවෙන් ලියවිල්ලකින් බලයලත් කෙනෙකුට ඉර පායන වේලාවටත් බහින වේලාවටත් අතර කොයියම් වේලාවකදී කොයියම් පාන් පෝර්ණුවකට ඇතුල්වී විභාගකරන්ට පුළුවන.

# LAND SALES.

## ඉඩම් විකිණීම.

No. 2,450, W. P.

වර්ෂ 1908ක්වූ මැයි මස 14 වෙනි දින කොළඹ
මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බස්නාහිර දිසාවේ වංශාධිපති ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1908ක්වූ ජූලි මස 3 වෙනි දිනවූ සිකුරාදා දවල් 12ට කොළඹ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට නොහොත් තීන්දුකරදෙන්ට යෙදෙනවා ඇත.

බස්නාහිර දිසාවේ මීගමු පලාතේ හාපිටිගම්කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 9ක්.

සිතියම 13,302.—හාපිටිගම්කෝරළේ යටිගහපත්තුව. ගම—හල්පෙ.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කර සක මිල. රු. |
|---|---|---|---|---|---|
| 21360 | වලරඹේකැලේ | ආණ්ඩුව | තහනම්කරන්ට තිබේ | 4 0 0 | — |
| 21362 | නැසින්ගලකන්දෙකැලේ | එම | එම | 3 0 10 | — |

සිතියම 13,305.—හාපිටිගම්කෝරළේ යටිගහපත්තුව. ගම—නාවින.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කර සක මිල. රු. |
|---|---|---|---|---|---|
| 21378 | උරගොඩයාකන්දෙකැලේ | ආණ්ඩුව | මීට යාව ඉඩමේ මිනිරන් සම්බවී තිබේ | 3 2 16 | —* |
| 21379 | එම | එම | එම | 5 1 14 | —* |

සිතියම 13,204.—හාපිටිගම්කෝරළේ උඩුගහපත්තුව. ගම—බෝතලේ.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කර සක මිල. රු. |
|---|---|---|---|---|---|
| 20874 | කුරපොතපිල්ලෑව | ආණ්ඩුව | මීට යාව ඉඩමේ මිනිරන් සම්බවී තිබේ | 0 0 36 | —† |
| 20875 | වනම්කන්දෙකැලේ | එම | අයිපාරට තහනම් | 0 0 16 | — |
| 20876 | එම | එම | මීට යාව ඉඩමේ මිනිරන් සම්බවී තිබේ | 3 0 8 | —† |

සිතියම 13,424.—හාපිටිගම්කෝරළේ යටිගහපත්තුව. ගම—යටිමිය.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කර සක මිල. රු. |
|---|---|---|---|---|---|
| 22026 | මහකන්දෙවත්ත | හ. රපියෙල් සිංඤෝ | 1 අවුරුදු පොල්පැල | 1 2 33 | 35 |
| 22027 | මහකන්දෙවත්තෙකැලේ | ආණ්ඩුව | කැලේ | 2 1 28 | 35 |

* මිනිරන් හෑරීමේ බලය ඇතුව රුපියල් 800යි.

† මිනිරන් හෑරීමේ බලය ඇතුව රුපියල් 1,00යි. බලය නැතුව රුපියල් 100යි.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණා බස්නාහිර දිසාවේ වංශාධිපති ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් ආදිය සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැක්කේ.

ගරුතර උතුමානන්වහන්සේගේ අණදෙවලෙස,

හියු ක්ලිෆර්ඩ්,
මහ සෙක්‍රතාරිස් වමහ.

---

No. 2,451, W. P.

වර්ෂ 1908ක්වූ මැයි මස 14 වෙනි දින කොළඹ
මහ සෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බස්නාහිර දිසාවේ වංශාධිපති ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1908ක්වූ ජූනි මස 30 වෙනි දිනවූ අඟහරුවාදා දවල් 12ට කොළඹ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට නොහොත් තීන්දුකරදෙන්ට යෙදෙනවා ඇත.

බස්නාහිර දිසාවේ කොළඹ පලාතේ පිහිටාතිබෙන බිම්කැබලි 15ක්.

සිතියම 12,935.—හේවාගම්කෝරළේ මැදපත්තුව. ගම—අත්ගම්පිටිය.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කර සක මිල. රු. |
|---|---|---|---|---|---|
| 19583 | මතින්එව නොහොත් කහටගහලන්ද | ආණ්ඩුව, හ. කිරා ඉල්ළුම්කාරයා | වගාවක් නැහැ | 2 0 22 | 30 |
| 19584 | කහටගහවත්ත | ආණ්ඩුව | 23 අවුරුදු පොල්ගස් 22ක්, හ. කතන්චියා විසින් අල්ලා තිබේ | 1 0 10 | 50 |
| 19585 | කහටගහලන්ද | එම | සොහොන්භූමියට තහනම් | 1 2 15 | — |
| 19586 | කහටගහවත්ත | ආණ්ඩුව, ග. මත්තෙස් සහ කෙනෙක් ඉල්ළුම්කාරයෝ | වගාවක් නැහැ | 0 3 20 | 30 |
| 19587 | එම | ආණ්ඩුව | 23 අවුරුදු පොල්ගස් 25ක්, ග. මත්තෙස සහ කෙනෙක් විසින් අල්ලා තිබේ | 1 1 20 | 50 |
| 19588 | කහටගහලන්ද | එම | වගාවක් නැහැ | 0 3 14 | 30 |
| 19589 | කහටගහවත්ත | එම | 23 අවුරුදු රබර්ගස්වලින් සම්පූර්ණයෙන් වගාකර තිබේ, රයිගම්වත්තේ සුපිරින්ටැන්ඩන් විසින් අල්ලා තිබේ | 2 0 8 | —* |

* මෙම ඉඩමේ අක්කරයක මිල විකිනීම දවසේදී දන්වනුලැබේ.

| නො. | ඉඩමේ නම. | අයිතිකාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කර යක මිල. රු. |
|---|---|---|---|---|---|
| | සිතියම 13,293. | නැගෙනහිර සියනෑකෝරලේ උඩුගහපත්තුව. | ගම—යටවක. | | |
| 21325 | වහළුන්ගේහේන | ආණ්ඩුව | බටකැලේ | 1 2 36 | 30 |
| 21326 | එම | ආණ්ඩුව, කා. තේගිස් විසින් අල්ලාතිබේ | 6 මාස පොල්පැල 6ක් | 2 0 24 | 35 |
| 21327 | ඇලමලකැලේ | ආණ්ඩුව | කැලේ | 0 2 36 | 30 |
| 21328 | ඇලමලහේන | ආණ්ඩුව, ග. පින්නාමිනයිදේ විසින් අල්ලා තිබේ | 1 අවුරුදු පොල්පැල 6ක් | 1 3 6 | 30 |
| | සිතියම 13,384. | නැගෙනහිර සියනෑකෝරලේ උඩුගහපත්තුව. | ගම—හැඹිදෙනිකන්ද. | | |
| 21746 | දෙඹන්ගහලන්ද | ආණ්ඩුව | බටකැලේ | 0 1 30 | 30 |
| 21747 | එම | එම | එම | 0 3 30 | 30 |
| 21748 | දෙඹන්ගහවලකුඹුර | එම | කුඹුර | 0 0 8 | 30 |
| 21749 | දෙඹන්ගහලන්ද | ආණ්ඩුව, ත. අන්දිරිස්අප්පු විසින් අල්ලා තිබේ | 6 අවුරුදු පොල්ගස් 6ක් | 1 1 24 | 35 |

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණා බස්නාහිර දිසාවේ වංශාධිපති ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් ආදිය සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

ගරුතර උතුමානන්වහන්සේගේ අණුවලෙස,

හියු ක්ලිෆර්ඩ්,
මහ සෙක්‍රතාරිස් වම්හ.

---

No. 2,452, W. P.

වර්ෂ 1908ක්වූ මැයි මස 18 වෙනි දින කොළඹ මහ සෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බස්නාහිර දිසාවේ වංශාධිපති ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1908ක්වූ ජූනි මස 30 වෙනි දිනවූ අඟහරුවාදා දවල් 12ට කොළඹ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට නොහොත් තීන්දුකරදෙන්ට යෙදෙනවා ඇත.

බස්නාහිර දිසාවේ කොළඹ පලාතේ සල්පිටිකෝරලේ පල්ලේපත්තුවේ පිහිටාතිබෙන බිම්කැබෙලි 1ක්.

සිතියම 13,369.—සල්පිටිකෝරලේ පල්ලේපත්තුව. ගම—නුගේගොඩ.

| නො. | ඉඩමේ නම. | අයිතිකාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කර යක මිල. රු. |
|---|---|---|---|---|---|
| 21705 | දෙල්ගහවත්ත | ආණ්ඩුව | 20 අවුරුදු පොල්පැල 2ක් | 0 0 39 | 3000 |

මෙම ඉඩම ගැණ වැඩිදුර කාරණා බස්නාහිර දිසාවේ වංශාධිපති ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම ගැන සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

ගරුතර උතුමානන්වහන්සේගේ අණුවලෙස,

හියු ක්ලිෆර්ඩ්,
මහ සෙක්‍රතාරිස් වම්හ.

---

No. 2,453, W. P.

වර්ෂ 1908ක්වූ මැයි මස 19 වෙනි දින කොළඹ මහ සෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බස්නාහිර දිසාවේ වංශාධිපති ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1908ක්වූ ජූලි මස 3 වෙනි දිනවූ සිකුරාදා දවල් 12ට කොළඹ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට නොහොත් තීන්දුකරදෙන්ට යෙදෙනවා ඇත.

බස්නාහිර දිසාවේ මීගමු සහ කොළඹ පලාත්වල පිහිටාතිබෙන බිම්කැබෙලි 4ක්.

සිතියම 6,332.—උතුරු අළුත්කුරුකෝරලේ දුනගහපත්තුව. ගම—වරදල.

| නො. | ඉඩමේ නම. | අයිතිකාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කර යක මිල. රු. |
|---|---|---|---|---|---|
| 9086 | ගිනිදමනගාරෙ | ලින්තොටගේ ප්‍රන්සිස්කු ප්‍රනාන්දු | වගාවක් නැහැ | 0 2 6 | 20 |
| | සිතියම 10,896.—සල්පිටිකෝරලේ පල්ලේපත්තුව. | | ගම—ගොරකපිටිය. | | |
| Q 798 | දූවෙකනත්ත | අ. සොබනාහාමි සහ තවත් | 10 අවුරුදු පොල්ගස් 1යි, 3සේ සිට 15 අවුරුදු පුවක්ගස් 10යි, කොස ගස් 7යි | 1 1 27 | 40 |
| | සිතියම 12,989.—හාපිටිගම්කොරලේ උඩුගහපත්තුව. | | ගම—මලදෙනිය. | | |
| 19867 | ගලබොඩවත්ත | ස. ජුස්තිනා | වගාව | 3 1 38 | 400 |
| | සිතියම 6,742.—හේවාගම්කෝරලේ මැදපත්තුව. | | ගම—බෝපෙ. | | |
| 313 | මුත්තෙට්ටුවෙම්බිට | ආණ්ඩුව | අල්ලාතිබී දැනට අත්ඇර තිබෙන ඉඩම | 0 2 23 | 25 |

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණා බස්නාහිර දිසාවේ වංශාධිපති ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් ආදිය සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

ගරුතර උතුමානන්වහන්සේගේ අණුවලෙස

හියු ක්ලිෆර්ඩ්,
මහ සෙක්‍රතාරිස් වම්හ.

**No. 2,454, W. P.**

වර්ෂ 1908ක්වූ මැයි මස 19 වෙනි දින කොළඹ
මහ සෙක්‍රටාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1908ක්වූ ජූලි මස 6 වෙනි දිනවූ සඳුදා දවල් 12·30ට කළුතර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත.

සිතියම 12,788. ගම—පැල්පොල. මෙම ඉඩම්වලට ඉල්ළුම්කාරයෙක් නැහැ.

| නො. | ඉඩමේ නම. | අයිතිකාමකියන්නා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කර යක මිල. රු. |
|---|---|---|---|---|---|---|---|
| 18782¼ | පහලවෙල | රජසන්තක | දෙනිය | 4 | 3 | 28 | 20 |
| 18782½ | එම | එම | එම | 2 | 0 | 2 | 20 |
| 18782¾ | එම | එම | එම | 1 | 0 | 2 | 20 |

සිතියම 13,438. ගම—නාතකඩ.

| නො. | ඉඩමේ නම. | අයිතිකාමකියන්නා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 22087 | දළුවෙලගොඩැල්ලකැලේ | — | දියබස්නාවකට තහනම්කිරීමට | 2 | 0 | 22 | — |
| 22088 | එම | රජසන්තක | කැලය | 18 | 3 | 21 | 30 |
| 22089 | දළුවෙලගොඩැල්ල | — | අඩිපාරට තහනම් කිරීමට | 0 | 0 | 12 | — |
| 22090 | හීනපිදෙණිය, කළුගහඹිට සහ පුවක්ගහවගුරඹිට | ජී. තේමානිස් සිල්වා සහ තවත් | දෙනිය | 4 | 3 | 20 | 30 |
| 22091 | එම | — | පාරටතහනම්කිරීමට | 0 | 2 | 26 | — |

පිහිටා තිබෙන්නේ රයිගම්කෝරලේ මුන්වත්තේබාගේ පත්තුවේය.

සිතියම 13,326. ගම—ඉන්ගිරිය. ඉල්ළුම්කාරයා—ජී. දියෝනිස්අප්පු.

| නො. | ඉඩමේ නම. | අයිතිකාමකියන්නා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 21487 | පරණගෙදරවත්තේකැලේ | රජසන්තක | කැලය | 2 | 3 | 26 | 50 |
| | ඉල්ළුම්කාරයා—කී. තේමානිස්අප්පු. | | | | | | |
| 21488 | එම | රජසන්තක | එම | 2 | 3 | 35 | 50 |
| | මේ ඉඩම්වලට ඉල්ළුම්කාරයෙක් නැහැ. | | | | | | |
| 21490 | හම්බොතකැලේ | රජසන්තක | එම | 0 | 0 | 29 | 35 |
| 21491 | එම | එම | එම | 0 | 0 | 26 | 35 |
| | ගම—උරුගල. ඉල්ළුම්කාරයා—ඊ. පොඩිසිඤ්ඤෝ. | | | | | | |
| 21492 | හපුගහගොඩකන්දපාවුලකැලේ | රජසන්තක | කැලය | 0 | 2 | 18 | 40 |
| | මේ ඉඩමට ඉල්ළුම්කාරයෙක් නැහැ. | | | | | | |
| 21493 | එම | — | දෙල දිගට තහනම් කිරීමට | 0 | 0 | 12 | — |
| | ඉල්ළුම්කාරයා—ජී. ආරොන් සිංඤෝ. | | | | | | |
| 21494 | එම | රජසන්තක | කැලය | 1 | 2 | 16 | 40 |
| | මේ ඉඩම්වලට ඉල්ළුම්කාරයෙක් නැහැ. | | | | | | |
| 21495 | එම | — | ඇල දිගට තහනම් කිරීමට | 0 | 0 | 16 | — |
| 21496 | හපුගහවත්ත | ජී. සියදෙරිස් සහ තවත් | වගාව | 0 | 0 | 4 | 50 |
| 21497 | එම | — | ඇල දිගට තහනම් කිරීමට | 0 | 0 | 6 | — |

සිතියම 13,257. ගම—ඉන්ගිරිය. ඉල්ළුම්කාරයා—ඊ. දොන් ආබ්‍රහම්.

| නො. | ඉඩමේ නම. | අයිතිකාමකියන්නා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 21140 | තින්දේහේන | රජසන්තක | කැලය | 4 | 3 | 12 | 45 |

පිහිටා තිබෙන්නේ රයිගම්කෝරලේ උඩුගහපත්තුවේය.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ කළුතර ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

ගරුතර උතුමානන්වහන්සේගේ අණ පරිදි,
හියු ක්ලිෆර්ඩ්,
මහ සෙක්‍රටාරිස් බම්බස.

---

**No. 2,273, C. P.**

වර්ෂ 1908ක්වූ මැයි මස 13 වෙනි දින කොළඹ
මහ සෙක්‍රටාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

මධ්‍යම දිසාවේ ගෞරවනීයවූ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1908ක්වූ ජූනි මස 26 වෙනි සිකුරාදින දවල් 12ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට නොහොත් තීන්දුවකට ගෙණෙන්ට යෙදෙනවා ඇත.

මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩපලාත කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 22ක්.

සිතියම 5,597. ගම—පුස්සල්ලාව.

| නො. | ඉඩමේ නම. | අයිතිකාමකියන්නා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කර යක මිල. රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| 14797 | වටගෙදරපතන | ආණ්ඩුව | පතන | 0 | 2 | 34 | 50 | 0 |
| 14799 | එම | එම | එම | 4 | 2 | 12 | 50 | 0 |
| 14800 | එම | එම | 6 අවුරුදු වයස්ගිය කැලේ වැවී තිබෙන හේන් | 0 | 3 | 4 | 100 | 0 |

සිතියම 5,565. ගම—දුනුකෙළල්ල.

| නො. | ඉඩමේ නම. | අයිතිකාමකියන්නා. | අන්දම. | අ. | රූ. | ප. | රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| 14635 | නුගහේන | පිටියේගෙදර කිරිබසිය සහ කරුණාතින්ගෙදර පිනා | අවුරුදු 4ෙර හිට 7 දක්වා වයස්ගිය හේන් සම්පූර්ණයෙන් වවා තිබේ | 0 | 3 | 0 | 48 | 12* |
| 14636 | ගොරකහේනේපතන | ආණ්ඩුව එකවතාවකදි ඉහතක් අය විසින් අයිතිකම්කියා තිබේ | පතන | 4 | 0 | 4 | 30 | 0 |

* වැඩිදියුණු කිරීමේ දෙකොත්පංගුව.

සිතියම 5,562. ගම—අටබාගේ.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කර යකට මිල රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| 14610 | කබරගල නොකොත් නුගේඇල්ල | ගම්පල දෙනස්සිමන්උන්නැහේ | 1 අවුරුද්දක් වයස්ගිය හේන් | 3 | 1 | 20 | 60 | 0 |
| 14611 | මීහිවිපොල | ගම්පල ඇස්. ආර්. ඇම්. පි. ඇල්. පි. පලනිඅප්පා සෙට්ටි | 9 අවුරුද්දක් ගතවූ හේන් සහ ග්‍රැවිලියා තිබේ | 9 | 0 | 26 | 250 | 0 |
| 14612 | එම | අටබාගේ උඩගම ඉළුක්පිටියේ ගෙදර අප්පුවා සහ හවඩියා | වත්ත, අවුරුදු 25 සිට 30 දක්වා වයස්ගිය කොස්, පුවක්, කැකුන ආදිය සහ ගෙවල් 2ක් තිබේ | 0 | 2 | 18 | — | |
| 14613 | එම | අටබාගේ උඩගම ඉළුක්පිටියේ ගෙදර සේදරා, හවඩියා සහ අප්පුවා | අවුරුදු 9ක් පමණ වයස්ගිය හේන් | 0 | 3 | 8 | 120 | 0 |
| 14614 | අලකොලබේ | ඇස්. ආර්. ඇම්. පි. ඇල්. පි. පලනිඅප්පා සෙට්ටි | 9 අවුරුද්දක් පමණ වයස්ගිය හේන් සහ ග්‍රැවිලියා | 1 | 0 | 20 | 230 | 0 |
| 14615 | එම | අටබාගේ උඩගම හොල්හවඩි ගෙදර කළු | කනාත | 0 | 0 | 22 | 20 | 0 |
| 14616 | මොරතලකුඹුර | හතුරුසිංහගෙදර පුංචා | කුඹුර | 0 | 2 | 0 | 600 | 0 |
| 14617 | මීහිවිපොල | ආණ්ඩුව | එම | 1 | 0 | 30 | 150 | 0 |
| 14618 | එම | දෙනියේගෙදර නන්දුවා | 5 අවුරුද්දක් පමණ වයස් හේන් | 0 | 1 | 34 | 50 | 0 |
| 14619 | මැහැවිපොලදෙනිය | ඉළුක්පිටියේගෙදර සේදරා | කුඹුර | 0 | 0 | 16 | 80 | 0 |
| 14620 | මීහිවිපොලකුඹුර | එම | එම | 0 | 0 | 33 | 600 | 0 |
| 14621 | මීහිපොලපතන | එම | එම | 0 | 1 | 12 | 30 | 0 |
| 14622 | මීහිවිපොලකුඹුර | දෙනියේගෙදර නන්දුවා | එම | 1 | 1 | 30 | 600 | 0 |
| 14623 | මීහිවිපොලකපුකොටුව | ඉළුක්පිටියේ ගෙදර සේදරා, හවඩියා සහ අප්පුවා | මාස 15ක් පමණ වයස්ගිය හේන් | 1 | 0 | 0 | 40 | 0 |
| U 891 | මීහිවිපොලහේන | එම | එම | 0 | 0 | 24 | 30 | 0 |
| V 891 | එම | එම | වත්ත, අවුරුදු 12ගේ සිට 20 වන තුරු වයස්වූ පුවක්, කොස්, ආදිය | 0 | 2 | 0 | 50 | 0 |
| W891 | මොරතොටකුඹුරේ වත්තේහේන | අටබාගෙ පල්ලෙගම හතුරුසිංහගෙදර පුන්චා | එම | 1 | 1 | 14 | 30 | 0 |

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ මධ්‍යම දිසාවේ ගෞරවනීයවූ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් දැනගත හැකිවත් ඇර, සිතියම් ගැන සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන් දැනගත හැකිවේ.

ගරුතර උතුමානන්වහන්සේගේ අණ‍ුවලෙස,

හියු ක්ලිෆර්ඩ්,
මහ ලේකම්තාරිස් වම්කා.

---

No. 2,274, C. P.

වර්ෂ 1908ක්වූ මැයි මස 19 වෙනි දින කොළඹ
මහ ලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

මධ්‍යම දිසාවේ ගෞරවනීයවූ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1908ක්වූ ජූනි මස 29 වෙනි දිනවූ සඳුදා පෙරවරු 12ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුනන්ට සෙදෙනවා ඇත.

මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩබුලත්ගම කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබෙලි 13ක්.

සිතියම 5,541. ගම—රඹුක්පිටිය.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | මුල්ගණන අක්කරයක්. රු. |
|---|---|---|---|---|---|---|---|
| 14546 | බැළුන්ගලහේනේපතන | ආණ්ඩුව, මුත්තු කොන්දෙස්තර විසින්අල්ලාගන තිබේ | හයමාසයක් ගිය හේන් තිබේ | 0 | 2 | 38 | 30 |
| 14547 | එම | ආණ්ඩුව | පතන | 0 | 1 | 35 | 15 |
| 14548 | එම | ආණ්ඩුව, මුත්තු කොන්දෙස්තර විසින්අල්ලාගන තිබේ | හයමාසයක් ගිය හේන් තිබේ | 0 | 1 | 14 | 30 |
| 14549 | එම | එම | තුන්අවුරුද්දක් ගිය හේන් තිබේ | 0 | 1 | 28 | 35 |

සිතියම 5,750.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 15164 | දෙහිගේහේනේපතන | ආණ්ඩුව, (ඉල්ළුම්පත්‍රයේ නොම්මර P 46/U. B. 1906) | පතන | 28 | 3 | 0 | 20 |
| 15165 | එම | කපුගෙදර පුන්චිරාල | 7 අවුරුද්දක් ගිය හේන් පඳුරු කිපයක් තිබේ | 0 | 1 | 13 | 30 |
| 15166 | එම | අළුත්ගෙදර පුංචිරාල | පතන | 0 | 2 | 10 | 15 |
| 15167 | එම | හල්පිටියේගෙදර කිරිමැනිකා | 7 අවුරුද්දක් පමණ ගිය හේන් තිබේ | 0 | 0 | 18 | 7* |

සිතියම 5,752. ගම—කොහොල්ගොමුව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 15172 | අම්බලමේඉඩම | ආණ්ඩුව | වත්ත, දෙඩම්ගස් 2ක්, කොහොල්ද තිබේ, සී. පී. ඞී. ආර්. නානායක්කාර අල්ලා තිබේ | 0 | 0 | 5·42 | 100 |

සිතියම 5,770. ගම—රඹුක්පිටිය.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 15580 | තෙඹුගොල්ලේපතන | ආණ්ඩුව, (ඉල්ළුම්පත්‍රයේ නොම්මරය P 31/U. B. 1907) | පතන | 8 | 0 | 0 | 15 |
| 15582 | හේරත්මනකැලේ | එම | මූකලාන | 10 | 3 | 38 | 48 |
| 15583 | හේරත්මනපතන | එම | පතන | 37 | 3 | 30 | 15 |
| 15584 | එම | එම | එම | 0 | 1 | 34 | 15 |

* තක්සේරුකල ගණන.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ මධ්‍යම දිසාවේ ගෞරවනීයවූ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ප්ලෑන් කඩදාසි ගැණ තොරතුරු සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිවේ.

ගරුතර උතුමානන්වහන්සේගේ අණ‍ුවලෙස,

හියු ක්ලිෆර්ඩ්,
මහ ලේකම්තාරිස් වම්කා

No. 2,191, S. P.

වර්ෂ 1908ක්වූ මැයි මස 6 වෙනි දින කොළඹ මහ සෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

දකුණු දිසාවේ මාතර පලාතේ උපඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1908ක්වූ ජූලි මස 8 වෙනි දිනවූ බදාදා දවල් 10ට මාතර කච්චේරියේදී වෙන්දේසිකර වික්කුණන්ට යෝදෙනවා ඇත.

දකුණු දිසාවේ මාතර පලාතේ වැල්ලබඩපත්තුවේද, කන්දබඩපත්තුවේද, වැලිගම්කෝරලේද යන කොට්ඨාසවල පිහිටා තිබෙන බිම්කැබෙලි 10ක්.

සිතියම 8,445. ගම—පල්ලේඅපරැක්ක.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප | අක්කර යක මිල. රු. ශ. |
|---|---|---|---|---|---|
| 24878 | බබාළුන්දගෙවත්තේගොඩැල්ලහේන | ඇල්. පී. දෙන් අන්දිරිස් සහ තවනෙක් | හේන | 15 1 20 | 17 50 |
| 24883 | බඹරුන්දගේදෙලේහේන | ඇස්. කේ. බබුන්හාමි | එම | 7 0 32 | 15 0 |
| | | ගම—උඩඅපරැක්ක. | | | |
| 24886 | උනගස්දෙලේහේන | ඇම්. කරෝලිස්හාමි | එම | 1 3 10 | 14 0 |
| 24888 | යද්දෙහිගේවත්තේදෙනිය | එම | එම | 0 0 2 | 14 0 |
| | | ගම—පල්ලේඅපරැක්ක. | | | |
| 24889 | මගහේන | ඇල්. පී. හින්නිහාමි | එම | 2 2 6 | 15 0 |
| | | ගම—උඩඅපරැක්ක. | | | |
| 24891 | එම | — | එම | 0 2 4 | 15 0 |
| 24893 | බුන්ගෙඩිවලේහේන | ආර්. පී. දෙන් ජුවානිස් | එම | 6 1 24 | 17 0 |
| 24895 | අන්ගුරුකොබුවේහේන | ජී. බබුන් | එම | 6 2 34 | 20 0 |
| | | සිතියම 6,603. ගම—මීපාවිට. | | | |
| 17926 | කෝදුරුමුල්ලේහේන | — | පැහිරි වැව්මට නිසි | 0 1 5 | 25 0 |
| | | සිතියම 3,870. ගම—වරකාපිටිය. | | | |
| 9519 | වැව | — | ඊ | 1 0 20 | 160 0 |

ඉහත සඳහන් ඉඩම් ගැන වැඩිදුර කාරණා මාතර උපඒජන්ත උන්නාන්සේගෙන් සහ පිඹුරු ගැන කාරණා සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

ගරුතර උතුමානන්වහන්සේගේ අණුවලෙස,

හියු ක්ලිෆර්ඩ්,
මහ සෙක්‍රතාරිස් වෙනුව.

---

No. 2,192, S. P.

වර්ෂ 1908ක්වූ මැයි මස 9 වෙනි දින කොළඹ මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

දකුණු දිසාවේ මාතර උපඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1908ක්වූ ජූලි මස 1 වෙනි දිනවූ බදාදා, පස්වරු 1ට මාතර කච්චේරියේදී තීන්දුකර දෙන්ට යෝදෙනවා ඇත.

දකුණු දිසාවේ මාතර පලාතේ කන්දබඩපත්තුවේ පිහිටා තිබෙන බිම්කැබෙලි 2ක්.

සිතියම 95.—කොරපාවිට.

| නො. | ඉඩමේ නම. | අන්දම. | මහත. අ. රූ. ප. | තක්සේරු ගණන. රු. |
|---|---|---|---|---|
| 28 A | පොතුවිලහේන | වත්ත | 30 3 20 | 30 |
| 28 B | වරතියකනක | එම | 0 2 37 | 30 |

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණා මාතර උපඒජන්ත උන්නාන්සේගෙන්ද, පිඹුරු ගැන කාරණා සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද දැනගත යුතුයි.

ගරුතර උතුමානන්වහන්සේගේ අණුවලෙස,

හියු ක්ලිෆර්ඩ්,
මහ සෙක්‍රතාරිස් වෙනුව.

---

No. 2,193, S. P.

වර්ෂ 1908ක්වූ මැයි මස 18 වෙනි දින කොළඹ මහ සෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

දකුණු දිසාවේ ගාල්ලේ මහ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1908ක්වූ ජූලි මස 9 වෙනි දිනවූ බ්‍රහස්පතින්දා දවල් 10ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර වික්කුණන්ට යෝදෙනවා ඇත.

දකුණු දිසාවේ ගාළු පලාතේ ගඟබඩපත්තුවේ පිහිටා තිබෙන බිම්කැබෙලි 21ක්.

සිතියම 7,777. ගම—මාබොටුවන. අයිතිකාරකමියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කර යක මිල. රු. |
|---|---|---|---|---|---|
| 22355 | ලභමුල්ලෙවෙරළුගහදූව | කනපැද්දලලොකුගේ ගිරිගෝරිස් | බැද්ද | 0 2 0 | 15 |
| | | සිතියම 7,776. ගම—ඌරල. | | | |
| 22354 | මිදුල්ලගස්කැටියෙදෙනිය | ජගොඩගේ අදිරියන් | දෙනිය | 1 [illegible] 8 | 15 |
| | | සිතියම 8,368. ගම—පහලගිඹිය. | | | |
| 24579 | කදුරුවලකන්ද නොහොත් නකුස්හිම්බියෙකන්දඅද්දර | ලොරැන්ස් දියස් සෙනවිරත්න | බැද්ද | 1 1 0 | 25 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කර යක මිල. රු. |
|---|---|---|---|---|---|
| | | සිතියම 7,574. ගම—ලෑරල. | | | |
| H 580 | මිදුල්ලෙමැදදුම්වේවත්ත | — | වත්ත | 1 2 18 | 15 |
| I 580 | මිදුල්ලෙඅළුත්වත්ත | — | එම | 0 3 18 | 15 |
| | | සිතියම 8,369. ගම—පහලකිඹිය. | | | |
| 24580 | වවුළුගලකන්ද | දෙඹගොඩලියනගේ දියෝනිස්අප්පු | බැද්ද | 1 1 0 | 25 |
| | | සිතියම 7,640. ගම—මාබොඩුවන. | | | |
| 21851 | උල්හේනේකපුගහකැලේ ඉහලඋඩුමුල්ලෙදෙනිය | ඇම්. ජගොඩගේ නිකුලස් | දෙනිය | 1 1 16 | 15 |
| | | සිතියම 7,639. ගම—මාබොඩුවන. | | | |
| 21850 | ගුහලේගොඩවත්තඅද්දර වත්ත | — | හේන | 0 2 21 | 15 |
| | | සිතියම 8,351. ගම—බද්දේගම. | | | |
| 24541 | වහුගහල්හේන | සී. ඩබ්ලිව්. ජයසේකර | බැද්ද | 2 3 12 | 30 |
| 24542 | එම | එම | එම | 5 2 24 | 30 |
| | | සිතියම 8,329. ගම—බද්දේගම. | | | |
| 24492 | කිතුල්කන්ද | ජේ. ජේ. දෙන් හෙන්ද්‍රික් ද සිල්වා | එම | 2 1 12 | 15 |
| 24494 | තුන්පිටපැත්තේබැද්ද | එම | එම | 1 2 25 | 15 |
| | | සිතියම 7,793. ගම—හැම්මැලිය. | | | |
| 22421 | ඉඳුරේවලදෙනියකන්ද | රැදගේ බ්‍රිස් | එම | 3 0 6 | 30 |
| 22422 | එම | එම | අල සහ වෙනත් දේවලට | 0 0 16 | 30 |
| | | සිතියම 7,327. ගම—හැම්මැලිය. | | | |
| 20757 | අවගොසිපලගොඩවත්ත | — | වත්ත | 0 1 33 | 15 |
| 20761 | කරල්පලදූම්වේවත්ත | — | එම | 0 3 34 | 15 |
| | | ගම—මහලපිපිය. | | | |
| 20765 | මහලපිටියේවත්ත | — | එම | 0 0 38 | 15 |
| | | සිතියම 8,457. ගම—අම්බෙජගම. | | | |
| 24918 | මොරහේනේදූව නොහොත් නැදුන්ගහදූව | — | කැලේ | 1 0 12 | 20 |
| | | සිතියම 8,482. ගම—වාඩුවැලිපිටිය. | | | |
| 24999 | අලුබතැන්න | වන්නිආරච්චිකන්කානන්ගෙයි එසාන්චිනාමි | එම | 1 3 22 | 20 |
| 25001 | එම | පැලවත්තේහෙට්ටිගෙයි උදරිස්අප්පු | එම | 1 1 6 | 20 |
| 25002 | එම | එම | එම | 1 3 37 | 20 |

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ ඒජන්ත උන්නාන්සේගෙන්ද, එවායේ සිතියම් සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

ගරුතර උතුමානන්වහන්සේගේ අණුවලෙස,

හියු ක්ලිෆර්ඩ්,
මහ ලේකම්තාරිස් වමන.

---

[Appraised value per acre of Land Sale No. 2,431, S. P., published in Gazette No. 6,238 of April 16, 1908.

වර්ෂ 1908ක්වූ අප්‍රේල් මස 16 වෙනි දින දරණ තැපැල්පත්‍රයේ නොම්මර 2,431යේ දුන්විමේ ප්‍රකාර බස්නාහිර පියසේ කෝරලේ අදිකාරිපත්තුවේ සියඹලාපේ තිබෙන මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුවේ ඉඩම්කට්ටිවල තක්සේරු මුදල අක්කරයකට රුපියල් 25 බැගින් නොව රුපියල් 15 බැගින් බව මෙයින් දන්වමි.

| ඉඩම්කට්ටිය. | | මහත. අ. රූ. ප. |
|---|---|---|
| 20883 | ... | 1 2 16 |
| 20884 | ... | 1 0 0 |
| 20885 | ... | 1 1 10 |
| 20886 | ... | 0 2 8 |

එච්. ඩබ්ලිව්. මිලිගන්,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

---

No. 967, P. OF U.

වර්ෂ 1908ක්වූ මැයි මස 14 වෙනි දින කොළඹ
මහ ලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය

ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1908ක්වූ ජූලි මස 2 වෙනි දිනවූ බ්‍රහස්පතින්ද දවල් 12ට බදුල්ලේ කච්චේරියේදි වෙන්දේසිකර විකුනන්ට හෝ බේරුම්කරන්ට යෙදෙනවා ඇත.

ඌව දිසාවේ බදුළු පලාතේ උඩුකිඳ, යටිකිඳ, වියළුව, වෙල්ලස්ස, බුත්තල, බින්තැන්න සහ වැල්ලවාය යන කෝරළේසවල පිහිටා තිබෙන බිම්කැබෙලි 22ක්.

ලංකාමැනීමේ සිතියම 19. ගම—කිනිගම. ඉල්ළුම්කාරයා—බින්දුවා.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කර යක මිල. රු. |
|---|---|---|---|---|---|
| 69 | ඉළුක්අරාවේහේන | ආණ්ඩුව | කැලේ | 1 2 35 | 45 |
| | | ලංකාමැනීමේ සිතියම 96. ගම—යටිකිඳ බෝගොඩකෝරලේ නැගෙණහිර වතුගෙදර. ඉල්ළුම්කාරයා—උනගොල්ලේ සුපරින්ටැන්ඩන්ට්. | | | |
| 1 | හපුගස්පිටියේහේන | ආණ්ඩුව | — | 2 0 22 | 200 |

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කරයක මිල. රු. |
|---|---|---|---|---|---|
| | සිතියම 1,230. ගම—වියළුවේ හාපත්ගමුව. ඉල්ලුම්කාරයෝ—දේවයා ඇලපුරයා සහ රත්නා. | | | | |
| 3993 | පරගහවලපිටියේහේන | ආණ්ඩුව | හේන | 2 3 20 | 30 |
| 3994 | පරගහවලපිටියේකුඹුර | එම | කුඹුර | 0 1 18 | 25 |
| 3995 | උරනත්වෙලේහේන | එම | හේන | 2 1 28 | 20 |
| | සිතියම 1,354. ගම—වෙල්ලස්සේ වැගම්පත්තුකෝරලේ කුනුවේගොල්ල. ඉල්ලුම්කාරයා—වේනා. අවන්නා. රූනා. ආරුමොනම්. | | | | |
| 4519 | පල්ලිබන්දුවැල්ලේයාය | ආණ්ඩුව | වී ගොවිතැනට යෝග්‍ය කුඹුර | 2 0 16 | 20 |
| 4520 | පල්ලිබන්දුවැල්ල | එම | කුඹුර | 0 3 9 | 20 |
| 4521 | එම නොහොත් දඹුවන්තලාවේයාය | එම | සිහින්කැලේ | 0 2 0 | 20 |
| | සිතියම 1,372. ගම—වෙල්ලස්සේ බගල්ලකෝරලේ ඔබ්බේකොට. ඉල්ලුම්කාරයා—ජේ. එච්. බැරීස් මහත්මයා. | | | | |
| 4577 | මරගලකැලේ | ආණ්ඩුව | කැලේ | 290 0 0 | 25 |
| 4578 | ගලේඅරුවේහේන | එම | හේන | 0 2 32 | 25 |
| 4579 | ගැඩමඹිගන්නයාය | එම | එම | 5 3 30 | 25 |
| | සිතියම 1,384. ගම—බුත්තල ඔක්කම්පිටිය. ඉල්ලුම්කාරයා—ඞී. මැද්දුමරාල. | | | | |
| 4675 | දෙල්ගස්වත්ත | ආණ්ඩුව | පොල්වත්ත | 0 2 14 | 25 |
| 4676 | එම | එම | හේන | 4 1 28 | 20 |
| | සිතියම 1,389. මෙම ඉඩම්වලට ඉල්ලුම්කාරයෙක් නැහැ. | | | | |
| F 150 | පන්සලේවත්ත | දෙමටමල්විහාරේ බාරකාරයා | වත්ත | 0 0 16 | —* |
| 4689 | දිවුල්ගහකුඹුර | එම | එම | 0 2 18 | 50† |
| G 150 | පුස්සැල්ලේකුඹුර | එම | එම | 0 1 19 | 50† |
| | සිතියම 1,037. ගම—බින්තැන්නේ පල්වත්තකෝරලේ පුවුල්ල. ඉල්ලුම්කාරයා—ඇන්. හරමානිස්අප්පු. | | | | |
| 3434 | ගලබැන්දහේන | ආණ්ඩුව | හේන | 3 1 17 | 15 |
| | සිතියම 2,930. ගම—වැල්ලවායේ වැල්ලවායකෝරලේ සුදුපානාවෙල. ඉල්ලුම්කාරයෝ—බින්දුවා සහ ජී. පී. දිනෝරිස් සිල්වා. | | | | |
| 102 | සුදුපානාවෙලකනත්ත | ආණ්ඩුව | වී ගොයිතැනට යොග්‍ය ඉඩම | 0 3 19 | 15 |
| 122 | එම | එම | එම | 1 1 1 | 15 |
| 148 | උඩවෙලකනත්ත | එම | පොල් වැවීමට යොග්‍ය | 3 1 26 | 15 |
| 199 | එම | එම | එම | 2 0 17 | 15 |
| 200 | එම | එම | එම | 3 1 2 | 15 |

* නිරවුල් බුක්ති සහතිකපත්‍රය සහ දියබද්ද. † දියබද්ද.

නොම්මර 2,930 දරණ මුල් සිතියමෙ (සුදුපානාවෙල) ඉඩම් අවුරුද්දකට අක්කරයකට රුපියල් 1 බැගින් වතුර බද්දකට යටත්ව විකුණන්ට යෙදෙනවා ඇත.

මෙම ඉඩම් ගැණ වැඩිපුර කාරණ ඌව දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

ගරුතර උතුමානන්වහන්සේගේ අණුවලෙස,

හියු ක්ලිෆර්ඩ්,
මහලේකම්තාරිස් වම්සා.

---

No. 749, P. OF S.

වර්‍ෂ 1908ක්වූ මැයි මස 14 වෙනි දින කොළඹ මහ ලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

සබරගමු දිසාවේ කැගල්ලේ උපඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1908ක්වූ ජූනි මස 30 වෙනි දිනවූ අඟහරුවාදා දවල් 10ට කැගල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත.

සබරගමු දිසාවේ කැගල්ලේ පලාතේ බෙලිගල්කෝරලේ යන කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම් කැබෙලි 18ක්.

සිතියම 479. ගම—නිවටුව. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | *අක්කරයක් පටන්ගන්න ගණන. රු. |
|---|---|---|---|---|---|
| 1231 | මඩගලඹුකලාන | — | ඹූකලාන | 10 2 0 | 50 |
| 1234 | මොරගොල්ලඹුකලාන | — | එම | 3 3 34 | 50 |
| | සිතියම 1,613. ගම—නියදඹුපොල සහ හල්ලව. | | | | |
| 4460 | මුදුපැනැල්ලේඹුකලාන | — | එම | 3 0 0 | 35 |
| 4461 | කදුරුගෙගියඹෙඩේඹුකලාන | — | එම | 0 3 10 | 35 |
| 4462 | බුළුවමුලඹුකලාන හෙවත් හෙට්ටිගලේඅතුර | — | එම | 9 1 26 | 35 |
| 4463 | එම | — | ඇලට ඉතුරුකරපු බිම | 3 1 8 | — |
| 4464 | එම | — | ඹූකලාන | 0 1 3 | 35 |
| 4465 | එම | — | එම | 0 3 1 | 35 |
| 4466 | එම | — | ඇලට ඉතුරුකරපු බිම | 0 1 6 | — |
| | සිතියම 1,634. ගම—වැලිගල්ල සහ පලඹුරේ. | | | | |
| 4514 | වල්ගන්කන්දේඹුකලාන | — | ඹූකලාන | 1 0 12 | 35 |
| | අයිතිකමකියන්නා—දිනෙස්පුවා සහ ආණ්ඩුව. | | | | |
| 4515 | නාගහමුලහේන | — | හේන | 1 2 5 | 30 |
| 4516 | බරුගොල්ලේහේන | — | එම | 0 3 16 | 35 |

| කො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කරයක් පටන්ගන්න ගණන. රු. |
|---|---|---|---|---|---|
| | | අයිතිකම්කියන්නා—ප්‍රභූලා සහ ආණ්ඩුව. | | | |
| 4518 | පල්ලේඹිව්ටේවත්ත | — | වත්ත | 1 1 4 | 30 |
| | | අයිතිකම්කියන්නා—දිනා සහ ආණ්ඩුව. | | | |
| 4519 | පුන්සේඅරඹේහේන | — | හේන | 2 1 6 | 30 |
| | | සිතියම 1,635. ගම—හල්ලව. අයිතිකම්කියන්නා—ආණ්ඩුව | | | |
| 4528 | කළුගලේමූකලාන හෙවත් වල්ගන්කන්දෙමූකලාන | — | මූකලාන | 1 1 30 | 35 |
| | | සිතියම 1,510. ගම—අවුගොඩ. | | | |
| 4235 | කිරිවාහේමූකලාන | ඇන්. මැණිකී | එම | 1 0 31 | 25 |
| | | සිතියම 1,671. ගම—සියඹලාපිටිය. | | | |
| 4597 | කිතුලේමූකලාන | කේ. සෙනදිරිසා | එම | 5 1 28 | 35 |
| | | සිතියම 1,282. ගම—බටුවත්ත. | | | |
| 3410½ | කැන්දගොල්ලේමූකලාන | ජේ. එච්. පී. බාලසූරිය මහතා | එලිකරපු ඉඩම | 0 2 6 | 50 |

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණා කෑගල්ලේ උපඒජන්ත උන්නාන්සේගෙන් දැනගන්ට පුළුවන. සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන් ලබාගත හැක.

ගරුතර උතුමානන්වහන්සේගේ අණුවලෙස,

හියු ක්ලිෆර්ඩ්,
මහ සෙක්‍රටාරිස් වම්බා.

---

No. 750, P. OF S.

වර්ෂ 1908ක්වූ මැයි මස 14 වෙනි දින කොළඹ
මහ සෙක්‍රටාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

සබරගමු දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1908ක්වූ ජූනි මස 22 වෙනි දිනවූ සඳුදා පස්වරු 1ට රත්නපුරේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට යොදනවා ඇත.

සබරගමු දිසාවේ රත්නපුර පලාතේ කුරුවිටිකෝරලේ පිහිටාතිබෙන බිම්කැබලි 4ක්.

සිතියම 173. ගම—තවිපවිච. කුරුවිටිකෝරලේ.

| කො. | ඉඩමේ නම. | අයිතිකම්කියන්නා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කර ගණ මිල. රු. |
|---|---|---|---|---|---|
| 347 | කැවකඩඇලමූකලාන සහ කළුවාමිලතැන්න | ආණ්ඩුව | මූකලාන | 217 0 31 | 50 |
| | | සිතියම 5,575. ගම—ගපිපවිච. | | | |
| 6412 | තනන්දිකැලේ | ආණ්ඩුව | එම | 130 0 0 | 50 |
| 6413 | එම | එම | එම | 29 0 18 | 50 |
| | | සිතියම 649. ගම—වැලිකුඹුර. | | | |
| 1983 | අඳුගලමූකලාන | ආණ්ඩුව | එම | 33 1 19 | 50 |

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණා සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

ගරුතර උතුමානන්වහන්සේගේ අණුවලෙස,

හියු ක්ලිෆර්ඩ්,
මහ සෙක්‍රටාරිස් වම්බා.

---

No. 344, S. O.

වර්ෂ 1908ක්වූ මැයි මස 12 වෙනි දින කොළඹ
මහ සෙක්‍රටාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ඉඩම් බේරුම්කරන කොමිසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1908ක්වූ ජූලි මස 4 වෙනි දිනවූ සෙනසුරාදා දවල් 12ට බදුල්ලේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට යොදනවා ඇත.

ඌව පලාතේ බදුල්ල දිස්ත්‍රික්කේ යටිකිඳ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 6ක්.

සිතියම 95. දික්වැල්ල.

| කො. | ඉඩමේ නම. | අයිතිකම්කියන්නා හෝ ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2a | බොරවත්තෙතම්බවල | ආණ්ඩුව | පතන | 5 0 29 |
| 2c | අඹිලිවැල්තැන්නෙපතන | එම | එම | 4 0 23 |
| 4j | අඹිලිවැල්තැන්නෙකිවුලහේන | එම | හේන | 11 3 5 |
| 4j1 | එම | එම | එම | 0 2 0 |
| 24a8 | දිප්පිටියෙවත්ත | කන්දෙරන්කුරේගෙදර හුදුවා | එම | 0 2 35 |
| 24d | බෝගහවත්ත | උඩඅරාවේ දෙවුයා | වත්ත | 2 0 0 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 20යි.

මේ ඉඩම් ගැණ වැඩිදුර කාරණා ඉඩම් බේරුම්කරන කොමිසාරිස් උන්නාන්සේගෙන්ද, එවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

ගරුතර උතුමානන්වහන්සේගේ අණුවලෙස,

හියු ක්ලිෆර්ඩ්,
මහ සෙක්‍රටාරිස් වම්බා.

No. 345, ෂ. ෆ.

වර්ෂ 1908ක්වූ මැයි මස 12 වෙනි දින කොළඹ මහ
සෙකුත්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1908ක්වූ ජූනි මස 30 වෙනි දිනවූ අඟහරුවාදා දවල් 12ට බණ්ඩාරවෙලදී වෙන්දේසිකාරයකුණත්ට හෝ බේරුම්කරදෙන්ට යෙදෙනවා ඇත.

ඌව පලාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොරළයේ පිහිටාතිබෙන බිම්කැබලි 11ක්.

සිතියම 121.—ගෝනාමුවාව.

| නො. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 6e | අස්වැද්දුම්මවත්ත | අස්වැද්දුම්ගෙදර කිරියා | වත්ත | 1 | 0 | 5 |
| 6c | කිරිමඩුවේහේන | ඒ. ගරුවා | එම | 0 | 3 | 10 |
| 6d | දරහිබුවගෙගොඩහේන | ආර්. ඇට්වැල් | එම | 1 | 2 | 5 |
| | සිතියම 115.—කහගොල්ල. | | | | | |
| 57g | ගල්කන්දෙහේන නොහොත් වටබැද්දේහේන | රඹුක්පොත රවේමහත්මයා | වත්ත සහ හේන | 4 | 0 | 32 |
| 70 | කොහෙල්වත්තඅරුවේහේන | එම | එම | 0 | 2 | 35 |
| 96a | ගල්කන්දෙපතන | ටී. පී. 58,530 අයිතිකාරයා | තේ | 0 | 0 | 25 |
| 96b | එම | එම | එම | 0 | 0 | 20 |
| 96o | එම | කහගොල්ලවත්ත අයිතිකාරයෝ | එම | 0 | 0 | 25 |
| 96k | කහගොල්ලවත්ත | එම | තේ | 0 | 1 | 30 |
| | සිතියම 118.—කැබිල්ලවෙල. | | | | | |
| 14 | ඇල්ලතොටවත්ත | මහතල්ගේ ජෝසැප් පීරිස් | වත්ත | 0 | 3 | 23 |
| 19a | ඇල්ලතොටහේන | එම | හේන | 0 | 0 | 16 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට 50 වනතුරුය.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන් සහ එවායේ සිතියම් සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

ගරුතර උතුමානන්වහන්සේගේ අණුවලෙස,

හියු ක්ලිෆර්ඩ්,
මහ සෙකුත්තාරිස් වම්හ.

## LAND ACQUISITION NOTICES.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

[Colombo District.]

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—කොම්පඤ්ඤවීදියේ රේල්පිලි දෙකක් දැමීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිය "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි ඛාණ්ඩයේ සාරන්බෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමානන්වහන්සේගෙන් ඡාසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම :—

සිතියම 13,483.

| නො. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| A 887 | මුඩුබිම | වී. කුමාරසාමි | 0 | 0 | 2·18 |
| B 887 | තේකඩේ කොටසක් සහ මුඩුබිම | වෙල්ලමාමදු | 0 | 0 | 0·37 |
| C 887 | පොල්ගහක් ඇති වත්තකින් පංගුවක් | අවේඑ මරික්කාර් | 0 | 0 | 1·12 |
| D 887 | කඩකාමර 4ක් ඇති ගොඩනැගිල්ලක් | නූර්දින් | 0 | 0 | 3 |
| E 887 | කඩකාමර 2ක් ඇති ගොඩනැගිල්ලකින් පඟුවක් සහ මුඩුබිම | ඒ. ඇල්. ඇම්. සමසදින්ගේ උරුමක්කාරයෝ | 0 | 0 | 2·62 |
| F 887 | කඩකාමර 10ක් ඇති ගොඩනැගිල්ලක් | මීරා රසා | 0 | 0 | 7·45 |
| | | | 0 | 0 | 16·74 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියෙ යනෑකට ත්බෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1908ක්වූ ජූනි මස 18 වෙනි දින 1කේ තනිසමට කොළඹ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1908ක්වූ මැයි මස 18 වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

එච්. ඩබ්ලියු. බ්‍රොඩ්හර්ස්ට්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

[Tender for provisioning Hospitals.]

මෙහි පහත සඳහන්වෙන සිවිල් ඉස්පිරිතාලෙට වර්ෂ 1908ක්වූ අවුරුද්දේ ඉතිරි ඇර තිබෙන කාලය තුළ කෑමදීමට කොන්ත්‍රාත්තු ගන්ට මනාප අයවළුන් විසින් මුද්‍රකරපු ටැන්ඩර්වල ඇන්විලොප්උඩ (Tender for provisioning Hospitals) "ඉස්පිරිතාලවලට කෑමදීමට ටැන්ඩර්" යන වාසගම ඇතුව එවන ඉල්ළුම්පත්‍ර වර්ෂ 1908ක්වූ ජූනි මස 1 වෙනි දින දවල් 12 වනතුරු භාර ගණු ලැබේ.

| | මුදලෙන් ඇප. රුපියල්. |
|---|---|
| අනුරාධපුර ඉස්පිරිතාලය | 350 |

2. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර එවනකොට කොපි දෙකක් එවිය යුතුයි. මෙයින් පළමුවෙනි කොපිය ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්යතුමාටද, දෙවෙනි කොපිය ගරුකටයුතු ආදායම් පරීක්ෂකතුමාටද (කොන්ට්‍රොලර් ඔෆ් රෙවනිව්) කෙළින්ම ඇරිය යුතුයි. මෙම කොපි දෙක එකදම අරින්ට ඕනෑය.

3. මෙම ඉල්ලුම්පත්‍ර ඒ නියමකර තිබෙන පෝර්ම කොලවල ඉල්ලුම්කළ යුතුයි. පෝර්මකොළ ලබාගන්ට පුළුවන් ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්යතැනගේ කන්තෝරුවෙන් සහ ඒ ඒ පලාත්වල ඉස්පිරිතාලවල් භාරව ඉන්න දොස්තර්වරුන්ගෙන්ය. ඉල්ලුම්පත්‍ර ඒ නියමකරතිබෙන පෝර්මකොලවල මිස වෙන අන්දමකින් ඉල්ලුවාට භාර නොගන්න බව දතයුතුයි.

මේ පෝර්මකොල වැදගත් සාක්ෂිකාරයෝ දෙන්නෙක් ඉදිරිපිටදී අත්සන්කළ යුතුයි. එක ඉල්ලුම්පත්‍රයක එක ඉස්පිරිතාලයක කොන්ත්‍රාත්තුව පමණක් ඉල්ලුම්කළයුතුයි.

4. සෑම ඉල්ලුම්කාරයෝම ටැන්ඩර්කොල ඉල්ලුම්කරනකොට මුදල් ඇප මුදලෙන් පංගුවක් බඳින්ට ඕනෑය. යම් අයෙක් ඉල්ලුම්කළායින් පසු කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට බැරිය කීවොත්, එසේ නැතුව ඔහුට ඊට සෑහෙන සහතික ඇප ආදිය දෙන්ට බැරිවුනොත්, එම අය විසින් පෝර්මකොළ ගන්ට බැඳපු මුදල් රජසන්තක වෙනවා ඇත. කොන්ත්‍රාත්තුව සව්වුනායින් පසු පෝර්ම කොල් ලබාගැනීමට බැඳපු මුදල ඒ අයවලුන්ට දෙනවා ඇත. පෝර්මකොල ලබාගන්ට බඳින මුදල් ට්‍රැෂරියේ නොහොත් කච්චේරියේ බැඳ ඊට කුවිතාන්සි ලබාගෙන එම කුවිතාන්සිය දී පෝර්මකොල ලබාගන්ට ඕනෑය. කච්චේරියක් නැති ස්ථානවලදී ඒ තැන්වල ඉස්පිරිතාල භාරව ඉන්න දොස්තර්වරුන් ලඟ මුදල් බැඳ පෝර්මකොල ඉල්ලුම්කළ යුතුයි.

5. කොන්ත්‍රාත්තුව පිට ඉස්පිරිතාලවලට දෙන්ට පොරොන්දුවෙන දේවල් දොස්තර් උන්නැහේ විසින් හොඳ බවට ඒත්තුගන්න අන්දමට නොහොත් හොඳ ජාති වලින් තිබෙන්ටත් ඕනෑය.

6. යම්විටකදී ඕනෑකලොත් ඒත්තුගන්ට යෙදුන දේවල්වලින් මෝස්තර (samples) තිබන්ට ඕනෑය.

7. බාරගන්ට යෙදුන ටැන්ඩර්කාරයා විසින් ඒ ඒ ඉස්පිරිතාලවලට නියමකර තිබෙන ඇප ගණන මුදලෙන් තබන්ට ඕනෑවත් ඇර ටැන්ඩරය බාරගත්තාය කියා දැනුම්දීපු දින පටන් පහලොස් දවසක් ඇතුළතදී එම ටැන්ඩරෙන් ඉල්ලා තිබෙන කොන්ත්‍රාත්තුව හරියාකාර ඉෂ්ටකරණ බවට ටැන්ඩරේ සමග එවන ඔප්පුව අත්සන් කරන්ට ඕනෑය. පෝර්මකොල ගන්ට බැඳපු මුදල ඇප මුදලේ කොටසක්කොට බාරගන්නවා ඇත මෙයින් පසු බාරගන්ට යෙදුන ටැන්ඩරයක අයිතිකාරයා මනාප විටක මුදල් වෙනුවට සහතිකකරපු ඉඩම් ඔප්පු තිබා අලුත් පොරොන්දු ඔප්පුවකට බැඳෙන්ට පුළුවන. මේ ගැණ වෙන්නාවූ සියලුම වියදම් ඔහු විසින් දරන්ට ඕනෑය.

ගරුකටයුතු මුදල් භාණ්ඩාගාරිකතැනගේ (Hon. the Treasurer) නමින් කොළඹ කච්චේරියේ ඇප බඳින්ට ඕනෑය. ඇප රුපියල් 500ක නොහොත් ඊට වැඩියේ ඇප බඳින්ට ඕනෑකරන කොන්ත්‍රාත්කාරයෝ කැමතිනම් ලංකාවේ තිබෙන කොයියම් බැංකුවක ගරුකටයුතු මුදල් භාණ්ඩාගාරික (Hon. the Treasurer) තැනගේ නමින් ඇප මුදල ස්ථිරවශයෙන් (Fixed deposit) තබන්ට පුළුවන.

මෙයින් පසු බාරගන්ට යෙදුන ටැන්ඩරයක අයිතිකාරයා මනාපවිටක මුදල් වෙනුවට සහතිකකරපු ඉඩම් ඔප්පු තිබා අලුත් පොරොන්දු ඔප්පුවකට බැඳෙන්ට පුළුවන. මේ ගැන වෙන්නාවූ සියලුම වියදම් ඔහු විසින් දරන්ට ඕනෑය.

8. යම් ටැන්ඩරයක් එවන්ට මත්තෙන් එම ටැන්ඩරේ යම් වරදක් කපාගා හරිගස්සන්ට ඕනෑකලොත් එම ස්ථානේ ටැන්ඩර්කාරයාගේ පුරුදු අත්සනේ මුල් අකුරු තබන්ට ඕනෑය. එසේ නොකර තිබුනොත් එම ටැන්ඩරේ බාරගන්නේ නැත.

9. මේ ගැන වැඩිදුර කාරණ දැනගන්ට ඕනෑනම් ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්යතැනගෙන් ඉල්ලුම්කළ යුතුයි.

10. යම්කිසි ටැන්ඩරයක් නොහොත් සියලුම ටැන්ඩර්ස් අහක්කෙරීමට සහ යම් ටැන්ඩරේකින් කොටසක් බාරගැනීමට බලය ආණ්ඩුව තබාගන්නවා දතයුතුයි.

11. පලාත්වල ඉස්පිරිතාලවලට කොන්ත්‍රාත්තු ඉල්ලුම් කරනකොට ස්වදේශක්කාරයින්ට සහ එරෝපාකාරයින්ට දෙන සැහැල්ලු ආහාර (low diets) වලට ගන්නා දේවල්වලට ගණන් ටැන්ඩර් පෝර්මවල තිබෙන ගණන් වලින් අරගෙන වෙන්වසයෙන් කිරි ඇතුව සහ කිරි නැතුව සැහැල්ලු ආහාර (low diets) වලට ගණන් පෙන්වා ඉල්ළුම්කරන්ට ඕනෑය.

(අත්සන්කළේ) ඇලන් පෑරී,
ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්යතැන.

වර්ෂ 1908ක්වූ මැයි මස 8 වෙනි දින
කොළඹ ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්ය
තැනගේ කන්තෝරුවේදීය.

---

[Tender for erecting Salt Stores, Hambantota.]

මෙහි පහත සඳහන් ගොඩනැගිලි සෑදීම පිණිස එවන ඉල්ලුම්පත්‍ර හෙවත් "ටැන්ඩර්ස්" හම්බන්තොට උපඡ්ජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1908ක්වූ මැයි මස 30 වෙනි සෙනසුරාද වනතුරු බාරගනු ලැබේ. එම ඉල්ලුම්පත්‍ර මුද්‍රකරණලද ඇන්විලොප්තුළ බහා "ලුණු ගුදම් සෑදීමේ ටැන්ඩර්" කියා පිට ලිවිය යුතුයි.

දිග අඩි 78ක්ද, පළල අඩි 17කුත් අඟල් 6ක්ද, උස අඩි 18ක් ඇති වරිච්චි බිත්තිවලින් යුත් ලුණු ගුදම් දහයක් හම්බන්තොට දිස්ත්‍රික්කේ බුන්දලෙහි තැනීමය. මෙකී ගුදම්වලට පොඩි සොප්පු තිබියයුතුවා පමණකුත්නොව එකී ගොඩනැගිලි සූරියගස්කැටපල සහ හෝන්පලමුල්ල යන ස්ථාන දෙකෙහි එක ස්ථානයෙහි පහ බැගින් සෑදියයුතුයි.

උපඡ්ජන්ත උන්නාන්සේ හෝ උන්නාන්සේ විසින් පරීක්ෂාකර රපෝර්තුකෙරීම පිණිස පත්කරණලද තැනැත්තාගේ හෝ මනාප හැටියට වර්ෂ 1908වේ දෙසැම්බර් මාසයට කල්මත්තෙන් සාදා නිමකළ යුතුය.

මෙහි විස්තර සටහන හම්බන්තොට කච්චේරියෙන් හෝ ලුණු දෙපාර්තමේන්තුවේ සුපිරින්ටැන්ඩන්ට්තැනගේ කන්තෝරුවෙන් හෝ දැනගත හැක.

ඉල්ලුම්කාරයෝ වැඩය අතික්‍රාන්තකළ හැකි දිනය ඉල්ලුම්පත්‍රයෙහි සටහන්කළ යුතුයි.

ඉල්ලුම්පත්‍රය උපඡ්ජන්ත උන්නාන්සේට යවන්නාවූ කාලයෙහිම එහි පිටපතක් ඉල්ලුම්කාරයා විසින් කොළඹ ගරුකටයුතු ආදායම්පරීක්ෂක උන්නාන්සේට යැවිය යුතුයි.

ඉල්ලුම්කාරයෝ හම්බන්තොට, මාතර නොහොත් ගාල්ලේ කච්චේරියේ රුපියල් 20ක් බැඳ ඊට ලැබෙන කුවිතාන්සිය උපඡ්ජන්ත උන්නාන්සේට වර්ෂ 1908ක්වූ මැයි මස 30 වෙනි දිනට ප්‍රථමයෙන් ඉල්ලුම්පත්‍රයත් සමග එවියයුතුය.

කොන්ත්‍රාත්තුවට බැඳීමට ඉල්ලුම්කාරයා සූදානම්ව නොසිටියොත් නොහොත් ඇපදීමට ඔහුට නුපුළුවන් වුනොත් ඔහු විසින් බඳිනලද මුදල ආණ්ඩුවට තහනම්වේ.

යම් ටැන්ඩරයක වැරැද්දක් කපාගා හරිගස්සන්ට ඕනෑකලොත් ඒ ස්ථානයේ ඉල්ලුම්කාරයාගේ අත්සනේ මුල් අකුරු තබන්ට ඕනෑය.

කොන්ත්‍රාත්තුව හරියාකාර ඉෂ්ටකරණ බවට එය අත්සන්කරන්ට මත්තෙන් රුපියල් 500ක ඇප බඳින්ට උවමනාවෙනවා ඇත.

යම්කිසි ඉල්ලුම්පත්‍රයක් නොහොත් සියලුම ඉල්ලුම්පත්‍ර අහක්කිරීමට සහ යම් ඉල්ලුම්පත්‍රයකින් කොටසක් බාර ගැනීමට බලය ආණ්ඩුව තබාගන්නවා ඇත.

මේ ගැණ වැඩිදුර කාරණ හම්බන්තොට උපඒජන්ත උන්නාන්සේගෙන් දැනගත හැක.

ඇල්. ඩබ්ලිවු. සි. ස්නාඩර්,
උපඒජන්ත වම්ග.

වර්‍ෂ 1908ක්වූ මැයි මස 9 වෙනි දින
හම්බන්තොට කච්චේරියේදීය.

---

[Close Season, North-Central Province.]

වර්‍ෂ 1891කේ අවුරුද්දේ නොම්මර 10යේ රෙගුලාසියේ 13 වෙනි වගන්තියේ 1 වෙනි අතුරු වගන්තියේ ප්‍රකාර උතුරු මධ්‍යම දිසාවේ මොනරුන් ඇර වෙන සතුන් දඩයම් තහනම් කාලය එක එක අවුරුද්දේ ජූනි මාසේ 1 වෙනි දින පටන් ඔක්තෝම්බ්‍ර මාසේ 31 වෙනි දින වනතුරු බව ප්‍රකාශකරමි. තවද ප්‍රකාශකරණලද ඒ කාලය තුළදී බලකඩදාසියක් ඇතුව හෝ නැතුව කිසිම කෙනෙකුට උතුරු මධ්‍යම දිසාවේ දඩයම්කිරීමට බැරි බව සහ එසේ කළොත් නීතිමාර්ගයට විරුඞ බවත් මෙයින් ප්‍රකාශකරමි.

ඒ. ඩබ්ලිවු සීමෝර්,
උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත
උන්නාන්සේ වෙනුවට.

වර්‍ෂ 1908ක්වූ මැයි මස 13 වෙනි දින
අනුරාධපුර කච්චේරියේදීය.

---

[Close Season, North-Central Province.]

වර්‍ෂ 1891කේ අවුරුද්දේ නොම්මර 10යේ රෙගුලාසියේ 13 වෙනි වගන්තියේ 1 වෙනි උපවගන්තියේ ප්‍රකාර උතුරු මධ්‍යම දිසාවේ මොනරුන් දඩයම් තහනම් කාලය එක එක අවුරුද්දේ නොවැම්බ්‍ර මාසේ 1 වෙනි දින පටන් ඊළඟ අවුරුද්දේ මාර්තු මාසේ 31 වෙනි දින වනතුරු බව මෙයින් ප්‍රකාශකරමි. තවද ඉහතකී ප්‍රකාශකරණලද කාලය තුළදී බලකඩදාසියක් ඇතුව හෝ නැතුව උතුරු මධ්‍යම දිසාවේ මොනරුන් ඇල්ලීමටද, වෙඩිතිබ්බීමට නොහොත් මැරීමට කිසිම කෙනෙකුට අවසර නැති බව මෙයින් දැනුම්දෙන්නා ඇත.

ඒ. ඩබ්ලිවු. සීමෝර්,
උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත
උන්නාන්සේ වෙනුවට.

වර්‍ෂ 1908ක්වූ මැයි මස 13 වෙනි දින
අනුරාධපුර කච්චේරියේදීය.

H. C. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.